## “වෙලින්ටන් නුවරින් සාධු නාදය නැගුනු දිනයක්”

නවසීලන්තයේ අගනුවර “වෙලින්ටන්” ය. වෙලින්ටන් නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල, ආසන්න වශයෙන් ශ්‍රී ලාංකීක බෞද්ධ පවුල් හයසීයක් පමණ වාසය කරයි. වෙලින්ටන් නගරාශ්‍රිතව ටාවා (Tawa) නැමති ප්‍රදේශයේ පිහිටි ධම්මගවේසි භාවනා මධ්‍යස්ථානය ශ්‍රී ලාංකික බෞද්ධයින් වෙනුවෙන් එම ප්‍රදේශයෙහි ඇති එකම ථේරවාදි බෞද්ධ මධ්‍යස්ථානයයි.

ධම්ම ගවේසි භාවනා මධ්‍යස්ථානය අතිපූජ්‍ය වැලිමඩ  ජිනාලංකාර ස්වාමීන් වහන්ද්‍රයන් වහන්සේගේ (හන්තේ ජිනාලංකාර) අනුශාසකත්වය යටතේ පවත්වාගෙන යනු ලබන අතර එම සේනාසනය මගින් ප්‍රදේශවාසි සහ නවසීලන්තවාසි බෞද්ධ ජනතාවට කෙරෙන සාසනික සේවාව අතිමහත්ය.

නිතිපතා සිදුකෙරෙන ධර්මදේසනා, ධර්ම සකච්ඡා, ශීල ව්‍යාපාර සහ භාවනා වැඩසටහන් ද, අභිධර්මය සහ පාලි භාෂාව ඉගැන්වීම් සඳහා පැවැත්වෙන වැඩ සටහන් ද, ශ්‍රීලාංකික නොවන බෞද්ධයින් සඳහා කෙරෙන විශේෂ භාවනා වැඩ සටහන් සහ ළමා පරපුර වෙනුවෙන් පැවැත්වෙන ධර්මය ඉගැන්වීමේ වැඩසටහන් ආදිය එම සාසනික මෙහෙවරේ වැදගත් අංගයෝය. ශ්‍රී ලාංකික මෙන්ම ශ්‍රී ලාංකික නොවන ජනතාවගේ මෙලොව පරලොව අභිවෘද්ධිය සඳහා ජිනාලංකාර ස්වාමීන් වහන්සේ විසින් ධම්ම ගවේසි භාවනා මධ්‍යස්ථානය හරහා ඉටුකරනු ලබන මෙම දහම් සේවාව අතිශය ප්‍රශංසනීය වේ.

පසුගිය නොවැම්බර් මස **5** සහ **6** යන දින දෙක තුල ධම්මගවේසි භාවනා මධ්‍යස්ථානයේ වාර්ෂික කඨින පූජෝත්සවය තුන්වැනි වරටත් ඉතාමත් අලංකාර, ශ්‍රද්ධාව වැඩෙන අන්දමින් පවත්වනු ලැබීය.  තම මවුරටින් සහ එහි පවතින බෞද්ධ පරිසරයෙන් සැතපුම් දහස් ගනනක් ඈත පිහිටි නවසීලන්තයේ ජීවත්වන ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට මෙසේ කඨින පූජෝත්සවයකට සහභාගි වීමට අවස්ථාව ලැබීම අතිශයින්ම භාග්‍යමත් අවස්ථාවක් විය. වෙලින්ටන් නගරයේ මෙන්ම නවසීලන්තයේ උතුරු දිවයිනේ පිහිටා ඇති පාමස්ටන් නෝත් (Palmerston North) නේපියර් (Napier) හේස්ටින්ස් (Hastings) හා නිව් ප්ලිමත් (New Plymouth) ආදි නගරවල වාසය කරණ ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාව විශාල පිරිසක් මෙම කඨින පූජෝත්සවය සඳහා සහාභාගි වූහ. එමෙන්ම නවසීලන්තයෙහි

හැමිල්ටන් (Hamilton) ඕක්ලන්ඩ් (Auckland)  ක්‍රයිස්ට්චර්ච් (Christchurch) ආදි නගරවලින් පැමිණි ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ද ඇතුළුව තායිලන්ත, ලාඕස් කාම්බෝජ සහ යුරෝපීය භික්ෂූන් වහන්සේලාගෙන් සමන්විත වූ දොළොස් නමක් පමණ මහා සංඝරත්නය මෙම අවස්ථාවට සහභාගි විය. මෙය නවසීලන්තය වැනි රටක ඉතාමත් දුර්ලභ මෙන්ම බොදුබැතිය වඩවන දර්ශනයක් විය.

නොවැම්බර් මස **5** වැනි දින සන්ධ්‍යා භාගයෙහි ඉතාමත් ම රමණීය අන්දමින් සැරසිල් කරණ ලද ශාලාවක දර්ශනීය පිරිත් මණ්ඩපයක් ඉදිකරන ලදි. එම දර්ශනීය පිරිත් මණ්ඩපය තුල වැඩහිඳ මහා සංඝ රත්නය සියළු දෙනාටම සෙත් පතා පරිත්‍රාන ධර්මය දේසනා කරනලදි. එසුදින උදෑසන වෙලින්ටන් නුවර ටාවාහි දහම් පාසැලේ සහ පාමර්ස්ටන් නෝත් හි ධම්මදීප දහම් පාසැලේ සිසු දරු දැරියන් ඇතුලු දෙමව්පියන්ගේ සහභාගීත්වයෙන් විසිතුරු පෙරහැරක් සංවිධානය විය. එම පෙරහැරින් මහා සංඝරත්නය එම සාලාව වෙත වඩමවාගෙන යනු ලැබීය. සති ගානක් තිස්සේ සැදැහැවත් දායක පිරිසක් විසින් විනයානුකූලව කපා මසා පඬු පොවා සකස් කරණ ලද කඨින චීවරයද එම පෙරහරින්ම වඩමවාගෙන යනු ලැබීය. ගැටබෙර, දවුල් බෙර වයමින්, කොඩි සේසත් ලෙලවමින්, සාධුකාර දෙමින් එම දරු දැරියන් විසින් මහා සංඝ රත්නය වඩමවාගෙන ගිය දර්ශනය මග දෙපස රුස්ව සිටි නවසීලන්ත ජාතිකයින්ට ඉතාමත් ආශ්චර්ය ජනක දර්ශනයක් විය.

එමෙන් ම ශාලාවෙහි පසක ඉදිකර තිබූ පූජා භාණ්ඩවලින් සැරසුණු කප්රුක මෙම කඨින උත්සවයෙහි තවත් විශේෂාංගයක් විය. කඨින චීවරය පූජාකිරීම, කප්රුක පූජාකිරීම, මහා සංඝරත්නය විෂයෙහි සපිරිකර දානය පිළිගැන්වීම ආදි සියලුම අංගවලින් සමන්විත වූ මෙම කඨින උත්සවය සැම දෙනාටම උතුම් වූ මහා පුණ්‍ය කර්මයක් විය.

මෙම දුර්ලභ කඨින චීවර පූජෝත්සවයට නොයෙකුත් අයුරින් දායක වී පිරිසිදු සිතින් කුසල් රුස්කරගැනීමට  නවසීලන්තයේ වෙසෙන ශ්‍රී ලාංකීක බෞද්ධ ජනතාවට මේ තුලින්  මාහැඟි අවස්ථාවක් උදාවිය. එවැනි වටිනා ආගමික පරිසරයක් සලසා දීම වෙනුවෙන් ධම්මගවේසි භාවනා මධ්‍යස්ථානාධිපති අති පූජනීය ජිනාලංකාර ස්වාමින් වහන්සේටත් එම උත්සවයේ සංවිධායක කමිටුවටත් කෘතඥතාවය පුදකර සිටින්නේ හදපිරි සතුටිනි.